

**හෙන්රි බී. අයිරින්**
**සභාපතිවරයා විසිනි**
පළමුවෙනි සභාපතිත්වයේ
පළමුවෙනි උපදේශකවරයා

# යාච්ඤාකිරීමට ඔවුන්ව දිරිගන්වන්න

මා කුඩා ළමයෙකුව සිටියදී, මගේ දෙමාපියෝ ආදර්ශය මගින් මට යාච්ඤාකිරීමට ඉගැන්වූහ. මා ආරම්භ කළේ බොහෝ ඈතක සිටින ස්වර්ගික පියාණන්වහන්සේගේ රූපයක් සිතින් මවා ගෙනය. මා පරිණිතවන විට, යාච්ඤාකිරීමේ මගේ අත්දැකීම වෙනස්විය. මගේ සිතේ තිබෙන රූපය ඉතා සමීපව සිටින, දීප්තිමත් හිරු එළියෙන් නැහැවෙන, මාව හොඳින් දන්නා, ස්වර්ගික පියාණන්වහන්සේගේ රූපයක් බවට පත්විය.

එම වෙනස ඇතිවුනේ, ජෝසෆ් ස්මිත්, 1820 දී නිව්-යෝර්ක්, මැන්චෙස්ටර්වලදී ලැබූ අත්දැකීමේ වාර්තාව සත්‍ය බවට ස්ථිර සාක්ෂියක් මා ලබාගැනීමත් සමගින්ය:

"හිරුගේ දීප්තිය ඉක්මවූ ආලෝක කදම්බයක් මගේ හිසට උඩින් මම දුටුවෙමි. එය මා මත පතිතවන තුරු ක්‍රමයෙන් පහත්විය.

"එය දර්ශනයවූ විගස මා බැඳ සිටි සතුරාගෙන් නිදහස්වූ බවක් මම වටහා ගතිමි. ආලෝකය මා මත පතිතවූ පසුව අවකාශයේ මට ඉහළින් සිටින විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනෙක් මා දුටු අතර, එම පුද්ගලයන්ගේ දීප්තිය සහ මහිමය වර්ණනා විෂය ඉක්මවීය. එයින් එක් අයෙක් මගේ නමින් මට කථා කොට, අනෙක් තැනැත්තා පෙන්වා—*මේ මාගේ ආදරණීය පුත්‍රයාය, ඔහුට සවන්දෙන්න යයි කීවේය*" (ජෝසෆ් ස්මිත්-ඉතිහාසය 1:16-17).

වසන්තයේ එම මනරම් දිනයේ ස්වර්ගික පියාණන්වහන්සේ සිටියේ එම තුරු වදුල තුලය. උන්වහන්සේ ජෝසෆ්ගේ නමින් ඔහුව අමතා, නැවත නැගිටුන ලෝකයාගේ ගැලවුම්කරුවාණන් උන්වහන්සේගේ "ආදරණීය පුත්‍රයාණන්" ලෙස හඳුන්වා දුන්සේක. ඔබ කොහේ සිටියද යාච්ඤාකරන සෑම විටම, එම මහිමාන්විත අත්දැකීමේ සත්‍යතාව ගැන ඔබගේ සාක්ෂිය මගින් ඔබ ආශිර්වාදිතවනු ඇත.

අප යාච්ඤාකරන පියාණන්වහන්සේ, මහිමාන්විත දෙවියන්වහන්සේ වන අතර, සිය ආදරණීය පුත්‍රයාණන් තුලින් ලෝක මැවූසේක. උන්වහන්සේ ජෝසෆ්ගේ යාච්ඤාව ඇසූ ලෙස, අපගේ යාච්ඤාද උන්වහන්සේගේ සමීපයේ සිට දුන් ලෙස ඉතා පැහැදිළිව අසනසේක. උන්වහන්සේ අපට කෙතරම් ප්‍රේම කළේද යත්, සිය පුත්‍රයාණන් අපගේ ගැලවුම්කරුවාණන් ලෙස දුන්සේක. එම දීමනාව මගින්. අපට අමරණීයත්වය සහ සදාකාලික ජීවනය ලබාගැනීමට උන්වහන්සේ හැකියාව ලබාදුන්සේක. තවද, උන්වහන්සේගේ පුතායාණන්ගේ නාමයෙන් කරන යාච්ඤාව තුලින්, මෙම ජීවිතයේදී අපට අවශ්‍ය සෑමවිටකදීම උන්වහන්සේ හා කථාකිරීමට අවස්ථාවද උන්වහන්සේ ලබාදෙනසේක.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්ත යන්ගෙන් යුත් සභාවේ පූජකවරය උසුලන්නන්ට එක් සාමාජිකයාගේ නිවසට ගොස් *වාචිකව සහ රහසින් යාච්ඤාකිරීමට ඔවුන්ව දිරිගැන්වීමට* පූජනීය කාර්‍යභාරයක් ඇත (බලන්න ධ්‍යසහ 20:47; අවධාරණ ඇතුළත්ය).

යාච්ඤාකිරීමට යමෙක් දිරිගැන්වීම සඳහා ක්‍රම කිහිපයක් ඇත. උදාහරණයක් ලෙස, නිතරම යාච්ඤාකිරීමට

දෙවියන්වහන්සේ අපට නියෝකර ඇතිසේක, නැතහොත්, ශුද්ධ ලියවිලි උදාහරණ සහ කෘතඥපූර්වක යාච්ඤා, ආයාචනා සහ විමසීම් තුලින් ආශිර්වාද ලැබුන අපේම අත්දැකීම් විස්තරකිරීමටද අපට හැකිය. නිදර්ශණයක් ලෙස, ස්වර්ගික පියාණන්වහන්සේ යාච්ඤාවලට පිළිතුරු දෙන බව සහතික කිරීමට මට හැකිය. මගේ මනසට පැමිණි වචනවලින් මට මගපෙන්වීම් සහ සහනය ලැබී තිබෙන අතර, එම වචන දෙවියන්වහන්සේගෙන් බව ආත්මයාණන් මගින් මම දනිමි.

අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ට එවැනි අත්දැකීමක් තිබුන බැවින්, ඔබටද එය ලබාගත හැකිය. හෘදයාංගම යාච්ඤාවකට මෙම පිළිතුර ඔහුට ලැබිනඃ

දෙවියන්වහන්සේ ඔහුගේ ආත්මයට සමාදානය පොරොන්දුවී, ඔහුගේ විපත් සහ හිරිහැර කෙටි කාලයකට බව කීසේක;

තවද ඉන්පසුව ඔහු හොඳින් දරාසිටිය හොත්, දෙවියන්වහන්සේ ඔහුව ඉහළින් ඔසවා තබනසේක (බලන්න ඕසහසී 121ඃ8-8).

එය මහත් ව්‍යසනයකදී ආදරණීය පියෙක්ගෙන් විශ්වාසවන්ත පුතෙකුට දුන් එළිදරව්වකි. දෙවියන්වහන්සේගේ සෑම දරුවෙකුටම යාච්ඤාව තුලින් උන්වහන්සේ සමග කථාකළ හැකිය. නිහතමානී යාච්ඤාවලට පිළිතුරු සමග ලැබෙන ප්‍රේමයේ සහ ආලෝකයේ හැඟීම් තරම් විශාල බලපෑමක් යාච්ඤාකිරීමට කරන අනුශාසනාව තුලින් හැර මට ලැබී නැත.

දෙවියන්වහන්සේගේ ඕනෑම පණතක් ගැන සාක්ෂියක් එම පණත ආරක්ෂාකිරීමෙන් අපට ලබාගත හැකිය (බලන්න යොහාන් 7ඃ17) අප නිතරම වාචිකව සහ රහසිගතව යාච්ඤාකිරීමේ නියෝගය අනුව මෙය සත්‍යයකි. ඔබගේ ගුරුවරයා සහ ඔබගේ මිතුරා ලෙස, දෙවියන්වහන්සේ ඔබගේ යාච්ඤාවලට පිළිතුරු දෙන බව මම ඔබට පොරොන්දුවෙමි, තවද ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන්, පිළිතුරු උන්වහන්සේගෙන් බව ඔබටම දැනගත හැකිය.

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

- "පාඩමක ප්‍රධාන අදහස ශක්තිමත්කිරීම සඳහා පින්තූර අගනා මෙවලම්ය" (*ඉගැන්වීමට වඩා ශ්‍රේෂ්ඨ කැඳවීමක් නැත* [1999], 176). ජෝසප් ස්මිත් හෝ පළවෙනි දර්ශනයේ චිත්‍රයක් පෙන්වන්න. යාච්ඤාව සමගින් ජෝසප් ස්මිත් ලැබූ අත්දැකීම ගැන සාකච්ඡාකරන්න. අයිරින් සභාපතිවරයා කළාක් මෙන්, ඔබද "ස්වර්ගික පියාණන් … සමීපයේ සිටින බව" මනසින් දුටුවහොත් ඔබගේ යාච්ඤා කොපමණ අර්ථවත් වේවිද?
- අයිරින් සභාපතිවරයා යෝජනාකරන ලෙස, යාච්ඤාව නිසා ඔබ ලබා තිබෙන ආශිර්වාද විස්තරකරමින්, නැතහොත් යාච්ඤාව ගැන ශුද්ධ ලියවිලි බෙදාගනිමින්, යාච්ඤාව ගැන ඔබගේ සාක්ෂිය දරන්න.

## තරුණඅය

### මගේ ඇඳහිල්ලේ යාච්ඤාව

**ප්‍රිසිලා ෆාරියස් ඩි ලිමා විසිනි**

මා 18වෙනි වියේ සිටියදී, වෙළඳ සේවකයෙකු ලෙස ගෘහභාණ්ඩ සාප්පුවක මම සේවය කළෙමි. මගේ කාර්ය සටහන ඉතා අසීරු එකක් විය, මම පූභා 8:00 සිට අභා10:00 දක්වා, සඳුදා සිට සෙනසුරාදා දක්වා සේවය කළෙමි. මා කණගාටු වූයේ ඉන්ස්ටිටියුට් සහ සභා ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට මට නොහැකිවූ නිසාය.

මම විශාල ඇදහිල්ලක් සමගින් ස්වර්ගික පියාණන්වහන්සේට යාච්ඤාකරමින් මට සෙනසුරාදා සේවයකිරීමට අවශ්‍ය නොවන රැකියාවක් සොයාගැනීමට උදව්කරන මෙන් ඉල්ලා සිටියෙමි. එවිට ඉන්ස්ටිටියුට් සහ වෙනත් කියාකාරකම්වලට යාමට මට හැකියාව ලැබෙන්නේය.

එක් දිනක් වැඩ වෙලාවේදී මම මිනිසෙකුට උදව්කරමින් සිටියෙමි. අප කථාකරමින් සිටින විට, විශාල බැංකුවක වැඩකළ බව ඔහු මට කීවේය. මෙම වෙළඳාම තුලින් රැකියාවකට තරඟ කරන්නේ කෙසේදැයි මම ඔහුගෙන් ඇසුවෙමි. ඔහු මට ඔහුගේ නම සහ දුරකථන අංකය ලබාදී, බඳවාගන්නාට කථාකර, මා ඔහුව හඳුනන බව කීමට මට කීවේය. බැංකුවට ගිය මම අවශ්‍ය විභාග කළෙමි. එයින් සමර්ථවූන මම සඳුදා සිට සිකුරාදා දක්වා දිනකට පැය හයක් වැඩකිරීම ආරම්භ කරමින්, කලින් ලැබූ ඉපයීම්වලට වඩා තුන් ගුණයක් ඉපයීම් ලදිමි.

අපි ස්වාමීන්වහන්සේට පළමු තැන දීමට කැමතිවන විට, උන්වහන්සේ අපට මග පෙන්වන බව මම දනිමි. උන්වහන්සේ අදටත් මට මගපෙන්වනසේක. යාච්ඤාවේ මූලධර්ම සත්‍ය බව මම දනිමි.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/11. පරිවර්තන අනුමැතියඃ 6/11. *First Presidency Message, February 2012* පරිවර්තනයයි. Sinhala. 10362 408

# උදුනේ ආරක්ෂකයයෝ

*මෙම ලිපිය අධ්‍යයනයකර, අදාල පරිදි, ඔබ බැහැදකින සොහොයුරියන් සමග එය සාකච්ඡා කරන්න.*

**ඇැදහිල්ල, පවුල, සහනය**

"උදුනේ ආරක්ෂකයෝ ඔබලාය" යයි ගෝර්ඩන්. බී. හින්ක්ලි සභාපතිවරයා (1910–2008) "පවුලඃ ලෝකයාට ප්‍රකාශනය" හඳුන්වාදෙමින්, 1995 දී ප්‍රධාන සහන සමිති රැස්වීමේදී කීවේය. "දරුවන් ලබන්නියෝ ඔබලාය, ඔවුන්ව ඇති දැඩි කරමින් සහ ඔවුන්ගේ ජීවිත තුල පුරුදු ඇතිකරන්නේද ඔබලාය. දෙවියන්වහන්සේගේ පුතුන් සහ දියණියන් ඇති දැඩි කිරීම තරම් දේවත්වයට බොහෝ සමීප වන වෙනත් කිසිදු වැඩක් නැත."[1]

අප වර්තමානයේ කුමන තත්වයක සිටියද—අපගේ බොහෝ වැදගත් වගකීම් කේන්ද්‍රවී තිබෙන්නේ පවුල් සහ නිවාස ශක්තිමත්කිරීම මත බව මෙම ප්‍රකාශනය මගින් සවිගැන්වී දැනට සම්පූර්ණයෙන්ම වසර 17කි. හින්ක්ලි සභාපතිවරයා මෙම ප්‍රකාශනය පළමුවෙන් කියවන විට, බාබරා තොම්ප්සන්, දැනට සහන සමිතියේ ප්‍රධාන සභාපතිත්වයේ දෙවන උපදේශිකාව, සෝල්ට් ලේක් දේවස්ථානයේ සිටියාය. "එය වැදගත් සිද්ධියකි," යයි ඇය සිහිපත්කරයි. "එම පණිවුඩයේ වැදගත්කම මට හැගින, මම මෙසේද සිතුවෙමි, 'මෙය දෙමාපියන්ට ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශයකි. එය දෙමාපියන්ට විශාල වගකීමකි.' මම මොහොතක් කල්පනා කළෙමි, එය සැබවින්ම මට එතරම්ම අදාල නොවේ, මන්ද මා අවිවාහකව සිටි අතර, මට දරුවන්ද කිසිවෙක් නැත. නමුත් විගසකින්ම වාගේ මට මෙසේ සිතිනි, 'නමුත් එය මටද අදාළවේ, මම පවුලක සාමාජිකාවක්මි, මම දියණියක්මි, සොහොයුරියක්මි, නැන්දනියකි, ලේලියක් සහ මිනිපිරියකි. මටද වගකීම්-සහ ආශිර්වාද ඇත, මන්ද මම පවුලක සාමාජිකාවක්මි. මගේ පවුලේ ජීවත්ව සිටින එකම සාමාජිකාව මා වුවද, මා තවදුරටත් දේව පවුලේ සාමාජිකාවක්මි, එසේම වෙනත් පවුල් ශක්තිමත් කරමින් උදව්කිරීමේ වගකීමක් මට ඇත.'"

වාසනාවකට මෙන්, අපගේ උත්සාහයන් තුල අප හුදකලා වී නැත. "විශාලතම උපකාරය," යයි කී තොම්ප්සන් සොහොයුරිය මෙසේද කියයි, "පවුල් ශක්තිමත්කිරීමෙන් අපට ලැබෙන්නේ, ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මය දැනගෙන, එය අනුගමනය කරමින්, අපට උපකාරකිරීමට උන්වහන්සේ තුල විශ්වාසය තැබීමය."[2]

## *අපගේ ඉතිහාසයෙන්*

"බෙත්සෙබා ඩබ්ලිව්. ස්මිත් සොහොයුරිය [1901–1910] දක්වා සහන සමිතියේ හතරවෙනි ප්‍රධාන සභාපතිනිය ලෙස සේවයකළ කාලයේදී, පවුල් ශක්තිමත්කිරීමේ අවශ්‍යතාවය දුටු නිසා, ඇය සහන සමිතියේ සොහොයුරියන් සඳහා මවගේ අධ්‍යයන පාඩම් ක්‍රමයක් ස්ථාපිත කළාය. එම පාඩම්වලට, විවාහය, නාරි ප්‍රසව උපකාර, සහ දරුවන් ඇතිදැඩි කිරීම ආදියද ඇතුළත්විය, මෙම පාඩම් සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්ගේ ඉගැන්වීම් වන, සහන සමිතියේ උපකාරකරන කාන්තාවන්ට නිවාසවල ඔවුන් සතු කාර්‍යභාරයට රුකුලක් විය:

"'පවුලට සහ පවුලේ රාජකාරි සම්බන්ධව, සහ අඩුවශයෙන් යුතුකම් ලෙස පවතින, ස්වාමිපුරුෂයා සහ භාර්‍යාව අතර, සහ දෙමාපියන් සහ ළමයින් අතර, නීත්‍යානුකූලව පවතින දේවල් සම්බන්ධ අවබෝධයේ යම් නොසළකා හැරීමක් හෝ යම් අඩුපාඩුවක් හෝ ඇති සෑම අවස්ථාවකදීම, මෙම සංවිධානය සිටියි නැතහොත් අත ළඟම සිටියි. එසේම සංවිධානයට අයත් සහජ එන්ඩවුමන්ට් සහ ආනුභාවය මගින් එම වැදගත් රාජකාරිවලට අනුකූල උපදෙස් දීමට ඔවුහු සූදානම්ව ලැහැස්තිවී සිටිති.'"[3]

**සටහන්**

1. ගෝර්ඩන් බී. හින්ක්ලි, "Stand Strong against the Wiles of the World," *Ensign*, නොවැ. 1995, 101.
2. බාබරා තොම්ප්සන්, "I Will Strengthen Thee; I Will Help Thee," ***Liahona*** සහ ***Ensign***, නොවැ. 2007, 117.
3. *Daughters in My Kingdom: The History and Work of Relief Society* (2011), 153.

## *ශුද්ධ ලියවිලි වලින්*

හිතෝපදේශ 22:6; 1 නෙපී 1:1; 2 නෙපී 25:26; ඇල්මා 56:46-48; දහම සහ ගිවිසුම 93:40

### *මට කුමක් කළ හැකිද?*

**1.** පවුල් ශක්තිමත්කිරීම සඳහා මා සෝදිසියෙන් සිටින සොහොයුරියන්ට මා උපකාරකරන්නේ කෙසේද?

**2.** මගේම පවුල තුල මා ධර්මිෂ්ඨ බලපෑමක් වන්නේ කෙසේද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/11. පරිවර්තන අනුමැතියඃ 6/11. *Visiting Teaching Message, February 2012* පරිවර්තනයයි. Sinhala. 10362 408